# ප්‍රසම්පාදන දැන්වීම
# ලංසු ආරාධනය

## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### සී/ස ලංකා පොහොර සමාගම

**සී/ස ලංකා පොහොර සමාගමේ ආරක්ෂක සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම.**
**2024/25 වර්ෂය**
**ලංසු අංකය: 2024/25/CFC/SS/01**

සී/ස ලංකා පොහොර සමාගමේ හුණුපිටිය පිහිටි ප්‍රධාන කාර්යාලය සමඟ මධ්‍යම පොහොර ගබඩා සංකීර්ණය,දිවයින පුරා ප්‍රාදේශීය පොහොර ගබඩාවන්හි වසරක කාල සීමාවක් එනම්,**2024 ජුනි මස 01 දින සිට 2025 මැයි මස 31** වන දින දක්වා ආරක්ෂක සේවාව සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති ආරක්ෂක ආයතන වෙතින් සී/ස ලංකා පොහොර සමාගම වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලබයි.

02. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් මඟින් සිදු කෙරෙනු ඇත.

03. ආපසු නොගෙවනු ලබන **රු.7,000/=ක(රුපියල් හත්දහසක)** මුදලක් වත්තල,හුණුපිටිය පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවීමෙන් සී/ස ලංකා පොහොර සමාගමේ වැ.බ කළමණාකරු (ප්‍රසම්පාදන හා ආනයන) වෙතින් මිල පෝරමය,පොදු කොන්දේසි සහ අවශ්‍යතාවයන් පිළිබඳ ලේඛණය ඇතුලු ඉංග්‍රීසි භාෂාවෙන් යුත් ලංසු පත්‍රිකාව ලබා ගත හැකිය.අදාල ලංසු පත්‍රිකා **2024 අප්‍රේල් මස 22 වන දින සිට 2024 මැයි මස 13 වන දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව.9.30 සිට ප.ව 3.30** දක්වා ලබා ගත හැක.

04. ලිපි කවරයේ බහාලු මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය,වත්තල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත්, ඉහත කී ලිපිනයේ ප්‍රසම්පාදන අංශයේ මේ සඳහා තබා ඇති ලංසු පෙට්ටියේ පහත සඳහන් කර ඇති ලංසු වසන දින හා වේලාවට පෙර බහාලිය යුතුය.

05. **2024 මැයි මස 14 වන දින පෙ.ව 11.30** ට ලංසුව වසනු ලබන අතර,ඒ සමඟම විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පැමිණ සිටිය හැකිය.සියලුම ලංසු සමඟ රුපියල් පන්ලක්ෂයක් (රු.500,000/=) වටිනා ලංසු ඇපකරයක් තැබිය යුතුය.

06. **2024 මැයි මස 07 වන දින පෙ.ව. 11.30** ට වත්තල, හුණුපිටියේ ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවතේ සී/ස ලංකා පොහොර සමාගමේ, ප්‍රසම්පාදන අංශයේදී පූර්ව ලංසු රැස්වීමක් පවත්වනු ලැබේ. මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගී වන මෙන් සියලුම ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

07. මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම්, සී/ස ලංකා පොහොර සමාගමේ වැ.බ කළමණාකරු (ප්‍රසම්පාදන හා ආනයන) (දුරකථන අංක:011-2947765/077-2069981/ෆැක්ස්: 011-2930423)ගෙන් ලබා ගත හැකිය.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රසම්පාදන අංශය,
සී/ස ලංකා පොහොර සමාගම,
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල
**දිනය:2024 අප්‍රේල් මස 22 වන දින**